# ගිණුම්කරණය

## 12 ශ්‍රේණිය

## 1.3ගිණුම්කරණ ක්‍රියාවලිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## නිපුනතා මට්ටම 1.3 - ගිණුම්කරණය ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි.

### ගිණුම්කරණ ක්‍රියාවලිය

ගිණුම්කරණය යෙදවුම් නිමවුම් ක්‍රියාවලියක් ලෙස හැඳින්විය හැක. එනම් භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියකදී අමුද්‍රව්‍ය යොදා ගෙන ඒවා කිසියම් ක්‍රියාවලියකට භාජනය කර භාණ්ඩ බවට පත් කර අවසාන නිමවුම ලබා ගන්නා අන්දමින් ගිනුම්කරණයේදීද, ගනුදෙනු හා සිද්ධීන් යොදා ගනිමින් ගිනුම්කරණ ක්‍රියාවලියේ අවසාන නිමවුම ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරයි.

**ගිණුම්කරණ ක්‍රියාවලිය පහත පරිදි ගැලීම් සටහනකින් නිරූපණය කළ හැකිය.**

| ගිණුම්කරණ යෙදවුම් → | ගිණුම්කරණක්‍රියාවලිය → | ගිණුම්කරණ නිමවුම් |
|---|---|---|
| ගනුදෙනු හා සිද්ධි | හඳුනාගැනීම<br>↓<br>මූලාශ්‍ර ලේඛණවල සටහන් කිරීම<br>↓<br>මූලික පොත්වල සටහන් කිරීම<br>↓<br>ලෙජරයට පිටපත් කිරීම<br>↓<br>ශේෂ පිරික්සුම පිළියෙල කිරීම<br>↓<br>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම | • ලාභාලාභ ප්‍රකාශනය<br>• මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය<br>• ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය<br>• මුදල් ප්‍රවාහ ප්‍රකාශනය<br>• ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් |

<u>මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලියේ පියවර</u>

01. ගනුදෙනු හඳුනාගැනීම (Identification)
02. ගනුදෙනු රැස් කිරීම (Collection)
03. ගනුදෙනු වාර්තා කිරීම (Recording)
04. වර්ග කිරීම (Classifying)
05. සාරාංශ කිරීම (Summarizing)
06. විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම (Interpreting)
07. සන්නිවේදනය කිරීම (Communication)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 01. ගනුදෙනු හඳුනාගැනීම

ව්‍යාපාරයේ සම්පත්වල වෙනසක් සිදුවන්නාවුත් කළමනාකරණ තීරණයක් වන්නා වුත් , මුදලින් මැනිය හැකි වූත් අතීත සිදුවීමක් ගනුදෙනුවක් ලෙස හැඳින්වේ.

ඒ අනුව මේ ලක්ෂණ ඇතුලත් සිදුවීම් ගිණුම්කරණ ක්‍රියාවලියේදී ගනුදෙනුවක් ලෙස හඳුනාගනු ලැබේ.

උදා :-

1. රු. 5000 ක භාණ්ඩ විකිණීම
2. රු. 10000 ක ප්‍රග්ධනයක් අයිතිකරු ව්‍යාපාරයට යෙදවීම
3. රු. 4000 ක රක්ෂණ ගාස්තු ගෙවීම.
4. රු. 1000 ක භාණ්ඩ ණයට ගැනීම.

මීට අමතරව කළමනාකරණ තීරණයකින් තොරව හටගන්නා වුත් ගනුදෙනුවක අනෙක් ලක්ෂණ ඇතුලත් සිද්ධි ද ගිණුම්කරණයේදී ගනුදෙනුවක් ලෙස හඳුනාගනු ලැබේ.

උදා :-

1. රු. 2000 ක තොගයක් හානි වීම.
2. රු. 5000 ක ණයගැතියකු බුන්වත් වීම.

## 02. ගනුදෙනු රැස් කිරීම (Collection)

කිසියම් ගිණුම්කරණ ඒකකයක යම් නිශ්චිත කාලපරිච්චේදයකට අදාළ ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ මූල්‍යමය තොරතුරු ඊට අදාළ මූලාශ්‍ර ලේඛනවලින් එක්රැස් කිරීම මෙහිදී සිදුවේ.

උදා :- ගැනුම් ඉන්වොයිසිය මගින් ණයට ගැනුම් ගණුදෙනුවලට අදාළ තොරතුරු රැස් කර ගැනීම.
විකුණුම් ඉන්වොයිසිය මගින් ණයට විකුණුම් ගණුදෙනුවලට අදාළ තොරතුරු රැස් කර ගැනීම
මුදල් ගෙවීම් වවුචර් මගින් මුදල් ගෙවීම් ගණුදෙනුවලට අදාළ තොරතුරු රැස් කර ගැනීම

## 03. වාර්තා කිරීම (Recording)

කිසියම් ගිණුම්කරණ ඒකකයක යම් නිශ්චිත කාලපරිච්ඡේදයකට අදාළව රැස්කරගන්නා ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ මූල්‍යමය තොරතුරු ඊට අදාළ මූලාශ්‍ර ලේඛන ඇසුරෙන් උපයෝගි පොත්වල ( මූලික පොත්වල) ඇතුළත් කිරීම වාර්තා කිරීම ලෙස හැඳින්වේ.

උදා :- ගැනුම් ඉන්වොයිසිය ඇසුරෙන් ගැනුම් ජ'නලය පිළියෙල කිරීම
විකුණුම් ඉන්වොසිය ඇසුරෙන් විකුණුම් ජ'නලය පිළියෙල කිරීම

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 04. වර්ග කිරීම (Classifying)

කිසියම් ගිණුම්කරණ ඒකකයක යම් නිශ්චිත කාලපරිච්ඡේදයකට අදාළව වාර්තා කරගන්නා ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ මූල්‍යමය තොරතුරු ගිණුම්කරණ මූලධර්ම වලට අනුව මූලික පොත් ඇසුරෙන් වත්කම් , වගකීම් , ආදායම් , වියදම් , හිමිකම් ගිණුම් ඇතුලත් ලෙජරයට පිටපත් කිරීම වර්ග කිරීම ලෙස හැඳින්වේ.

උදා :- ණයට විකුණුම්, ණයගැති ගිණුමට හා විකුණුම් ගිණුමට සටහන් කිරීම.

## 05. සාරාංශ කිරීම (Summarizing)

කිසියම් ගිණුම්කරණ ඒකකයක යම් නිශ්චිත කාලපරිච්ඡේදයකට අදාළව වර්ග කරගන්නා ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ මූල්‍යමය තොරතුරු ඇල්මක් දක්වන පාර්ශවයන්ට පහසුවෙන් හඳුනාගත හැකිවන පරිදි සම්පිණ්ඩනය කර දැක්වීම සාරාංශ කිරීම ලෙස හැඳින්වේ.

උදා :- කිසියම් නිශ්චිත දිනකට ශේෂ පිරික්සුම පිළියෙල කිරීම

ආදායම් ප්‍රකාශනය (කාර්යසාධන පත්‍රය) පිළියෙල කිරීම

ශේෂ පත්‍රය (මූල්‍ය තත්වය වෙනස්වීමේ ප්‍රකාශනය) පිළියෙල කිරීම

## 06. ගනුදෙනුවල ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම හා අර්ථකථනය කිරීම (Interpreting)

කිසියම් ගිණුම්කරණ ඒකකයක යම් නිශ්චිත කාලපරිච්ඡේදයකට අදාළව වර්ග කරගන්නා ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ මූල්‍යමය තොරතුරු සාරාංශ කිරීමෙන් ලබාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපල සම්බන්ධයෙන් වඩා පුළුල් වුත් නිවැරදි වුත් අදහසක් ලබාගැනීම සඳහා එම ප්‍රතිඵල තවදුරටත් විග්‍රහ කිරීම, ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම හා අර්ථකථනය කිරීම ලෙස හැඳින්වේ.

උදා :- ශුද්ධ ලාභ අනුපාත ගණනය කිරීම
ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීම
ණය හා ප්‍රාග්ධනය අතර ඇති අනුපාතය ගණනය කිරීම

## 07. ප්‍රතිඵල සන්නිවේදනය කිරීම (Communication)

කිසියම් ගිණුම්කරණ ඒකකයක යම් නිශ්චිත කාලපරිච්ඡේදයකට අදාළව වර්ග කරගන්නා ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ මූල්‍යමය තොරතුරු සාරාංශ කිරීමෙන් ලබාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිඵල විග්‍රහ කිරීමෙන් අනතුරුව, ව්‍යාපාරය පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන් වෙත ලබා දීම ප්‍රතිඵල සන්නිවේදනය ලෙස හැඳින්වේ.

උදා :- අයිතිකරුවන්ට හා කළමනාකරුවන්ට මූල්‍ය තොරතුරු සැපයීම.

මහජනතාවට අවශ්‍ය තොරතුරු සැපයීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

**පුනරීක්ෂණ :-**

**1.** පහත සඳහන් ගනුදෙනුවලට අදාළ තොරතුරු සටහන් වී ඇති මූලාශ්‍ර ලේඛන නම් කරන්න.

I. අත්පිට විකුණුම් රු. 25000කි.

II. රක්ෂණ ගාස්තු ගෙවීම රු. 4000කි.

III. විකිණීම සඳහා රු. 45000ක තොගයක් අමල්ගේ ව්‍යාපාරයෙන් ලබා ගන්නා ලදී.

IV. රු. 2000ක බඩු තොගයක් ඉල්ලූ වර්ගයට වඩා වෙනස්වීම මත අමල්ගේ ව්‍යාපාරයට හරවා යවන ලදී.

**2.** ඉහත 1 හි ගනුදෙනු සටහන් කිරීම සඳහා යොදා ගන්නා මූලික පොත් නම් කරන්න

**3.** ගිණුම්කරණ ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලින් ලියන්න.

**4.** පහත සඳහන් දෑ ලබා ගැනීමට පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන නම් කරන්න.

I. කාලච්ඡේදයේ ලාභය

II. වත්කම්, වගකීම් හා හිමිකම්වල තත්ත්වය

III. මූල්‍ය තත්ත්වය වෙනස්වීම්

Copyright © www.e-thaksalawa.moe.gov.lk